# 2.

## මහා මංගල සූත්‍රය

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ, අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා, අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා, යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

1. බහුදේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගලමුත්තමං

2. අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා
පූජා ච පූජනීයානං - ඒතං මංගලමුත්තමං

3. පතිරූපදේසවාසෝ ච - පුබ්බේ ච කතපුඤ්ඤතා
අත්තසම්මා පණිධි ච - ඒතං මංගලමුත්තමං

4. බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා - ඒතං මංගලමුත්තමං

5. මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා - ඒතං මංගලමුත්තමං



## මහා මංගල සූත්‍රය (සිංහල තේරුම)

මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක සැවැත් නුවර ජේතවනාරාමය, නම් අනේපිඬු සිටුතුමාගේ ආරාමයෙහි බුදු පියාණෝ වැඩවසන සේක්, ඒ සඳ එක් දෙවියෙක් රැය ඉක්මවායන යාමයෙහි, ශරීර ශෝභාවෙන් ජේතවනය බබුළුවා, බුදුරදුන් යම් තැනක වෙසෙත් ද, එතැනට පැමිණ බුදුන් වැඳ එකත්පස්ව සිටියේ ය. එසේ සිටිමින් මේ ගාථාවෙන් මෙසේ කීවේ ය.

1. යහපත කැමති බොහෝ දෙවියෝද මනුෂ්‍යයෝ ද සත්වගට සෙත සලසන මංගල කරුණු ගැන සිතූහ. ඒ උතුම් මඟුල් (කවරේදැයි) වදාළ මැනවි.
2. බාලයන් ඇසුරු නොකිරීම, පණ්ඩිතයන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම යන මේවා උතුම් මඟුල් වෙයි.
3. සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, පෙර කළ පින් ඇති බව, සිය අත්බව දහම් හි පිහිටුවීම යන මේවා උතුම් මඟුල් වෙයි.
4. බහුශ්‍රැත (වියත්) බව, සිප් සතර හුරු බව, විනය සහ ශික්ෂණය ඇතිබව, ප්‍රිය වචන ඇති බව ද යන මේවා උතුම් මඟුල් වෙයි.
5. මව්පිය උපස්ථානය, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම, නිරවුල් කර්මාන්තය ද යන මේවා උතුම් මඟුල් වෙයි.

6\. දානඤ්ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සංගහෝ
අනවජ්ජානි කම්මානි - ඒතං මංගලමුත්තමං

7\. ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගලමුත්තමං

8\. ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවණං - ඒතං මංගලමුත්තමං

9\. ඛන්තී ච සෝවචස්සතා - සමණානඤ්ච දස්සනං
කාලේන ධම්මසාකච්ඡා - ඒතං මංගලමුත්තමං

10\. තපෝ ච බ්‍රහ්මචරියං ච - අරියසච්චානදස්සනං
නිබ්බාණ සච්ඡිකිරියා ච - ඒතං මංගලමුත්තමං

11\. ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං - ඒතං මංගලමුත්තමං

12\. ඒතාදිසානි කත්වාන - සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති, තං
තේසං මංගලමුත්තමන්ති.



6. දන්දීම, කුසල් දහම් හි හැසිරීම, නෑදෑයන්ට සංග්‍රහ කිරීම, වැරදි නැති කටයුතු කිරීම ද යන මේවා උතුම් මඟුල් වෙයි.

7. සියලු පවෙහි නොඇලීම ද පවින් වැළකීම ද මත් දෑ පානයෙන් වැළකීම, කුසලයෙහි නොපමා බව ද යන මේවා උතුම් මඟුල් වෙයි.

8. ගරු කළ යුත්තන්ට ගරු කිරීම, උඩගු නොවන බව, තෘප්තිමත් බව, කළගුණ දත් බව, සුදුසු කල බණ ඇසීම ද යන මේවා උතුම් මඟුල් වෙයි.

9. ඉවසීම, සුවච බව, සුසිල්වත් සඟුන් දැකීම, සුදුසු කල්හි දහම් සාකච්ඡාව ද යන මේවා උතුම් මඟුල් ය.

10. තපස, බඹසර, චතුරාර්ය සත්‍ය දැකීම, නිවන් පසක් කිරීම ද යන මේවා උතුම් මඟුල් ය.

11. අටලෝ දහමෙහි ගැටෙනා ලදුව යමෙකුගේ සිත නොසැලේ ද, ශෝක නොකරයි ද, නිකලෙස් බවින් නිරුපද්‍රිත ද, මේවා උතුම් මඟුල් ය.

12. මේ උතුම් මංගල කරුණු පිළිපැද, සෑම තැන්හි නොපැරදී, සියලු ඉරියව්වෙහි ම සුඛිතව වෙසෙත් ද, මේවා උතුම් මඟුල් ය.